

# ඔබේ ඉ-තැපැල (E-mail) සුරක්ෂිත කරගන්නේ කෙසේද?

## ඉ-තැපැල යනු කුමක්ද?

ඉ-තැපැල යනු එක් අයෙක් හෝ කිහිපදෙනෙකු වෙත පණිවුඩ හුවමාරුකර ගැනීමේ යාන්ත්‍රික උපක්‍රමයකි. මෙහිදී පණිවිඩය, පණිවිඩ ලබන්නෙකු/ලබන්නන් වෙත යැවෙනු ලැබේ. මේ අයුරින් පණිවිඩ යැවීම හෝ ලබා ගැනීම සඳහා ප්‍රථමයෙන්ම ඔබ ඉ-තැපැල් ගිණුමක් විවෘත කරගත යුතුයි. දැනට නොමිලේ ඉ-තැපැල් ගිණුම් සාදාගැනීම සඳහා සේවා සපයන්නන් බොහෝ සංඛ්‍යාවක් සිටී. ඉන් ප්‍රධාන සමාගම් කිහිපයක් පහත දැක්වේ.

උදා:
1. Yahoo
2. Google
3. Hotmail

## ඉ-තැපැල් සුරැකුම

වත්මනෙහි තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශාල වශයෙන් අනතුරට භාජනය විය හැකි හා අයුතු ප්‍රයෝජන ගන්නා තත්ත්වයන් ඉතා ඉහළ නිසා ඉ-තැපැල් සුරක්ෂිතතාව සඳහා වඩාත් සැලකිලිමත් විය යුතුයි. මෑත කාලීන සමීක්ෂණයන්ට අනුව ඊමේල් යනු ව්‍යාපාර සන්නිවේදනය තුල ඇති වඩාත් වටිනා ක්‍රමවේදයකි. එය ජංගම දුරකථන පවා අභිබවා යන වටිනාකම් සහිත සේවාවකි. එමනිසා බොහොමයක් ආයතන පමනක් නොව සාමාන්‍ය ජනතාව පවා ඒ පිළිබඳ ව වැඩි සැලකිල්ලක් දැක්වීම පුදුමයට කරුණක් නොවේ.

## ඉ-තැපැල් ආරක්ෂාව සඳහා ඇති තර්ජන මොනවාද?

### වෛරස (Viruses)

සියලුම දත්ත හා තොරතුරු  විනාශ කොට මුලු පරිගණක පද්ධතිය ම බිඳ දැමීමට තරම් හැකියාවක් වෛරස් සතුව පවතී.

### අයාචිත තැපැල (Spam)

මෙය ද ඉ-තැපැල් ආරක්ෂාවට ඇති තර්ජනයක් වන අතර මෙහි ඇති ධාරිතාව පද්ධතියේ පැවැත්මට සෘජුවම බලපායි. එමෙන් ම වෛරස් ගෙනයාමේ හැකියාවක් ද ස්පෑම් සතු වේ.

### තතු බෑම (Phishing)

ව්‍යාජ අනන්‍යතාවය මගින් අන්තර්ජාලය හා ඉ-තැපැල් භාවිතයෙන් සිදුකරන වෙළදාම් කටයුතු අඩපණ කිරීම මෙමගින් සිදුකරයි. අන්තර්ජාලය  හා ඉ-තැපැල හරහා වෙළඳ හා මුදල් සම්බන්ධ ගණුදෙනු සිදුකරන ආයතන/පුද්ගලයින් මෙහි ප්‍රහාරකයන්ගේ ප්‍රධාන ඉලක්ක වේ. ස්පෑම් තුලින් විශාල ඉ-තැපැල ප්‍රමාණයක් භාවිතා කරමින් පරිශීලකයන්ගේ තොරතුරු ඉතා සූක්ෂම ලෙස ලබා ගෙන එමගින් නොයෙකුත් ප්‍රහාර හා විනාශකාරී ක්‍රියා සිදුකිරීම මෙහි ඇති භයානක තත්වයයි.

## ඉ-තැපැල් තර්ජන වලට එරෙහිව ගත හැකි පොදු සරල ක්‍රියාමාර්ග

ඔබේ ඉ-තැපැල් ගිණුම  විවෘත කිරීමට පෙර,

- ඔබගේ ප්‍රතිවෛරස මෘදුකාංගය යාවත්කාලීන දැයි පරීක්ෂා කර බලන්න.

නව ඉ-තැපැල් පණිවිඩයක් ලැබීමේ දී,

- එවන්නාගේ වලංගුතාවය පරීක්ෂා කරන්න. (එසේ වලංගුතාවය පිළිබඳ සැකයක් පවතී නම් එය අතහැර දමන්න.)
- එහි අන්තර්ගතය (මාතෘකාව, අඩංගු පණිවිඩය, ඇමුණුම්) විශ්වාසදායී දැයි පරීක්ෂා කරන්න. (එසේ විශ්වාස දායි නොවේ නම් එය අතහැර දමන්න.)


.LK
Internet Society Sri Lanka Chapter
TechCERT
HELPING YOU SECURE YOUR INFORMATION ASSETS

## විශේෂ සළකා බැලීම්

- නොදන්නා පාර්ශවයකින් ඉ-තැපැල් පණිවිඩයක් ලැබුණු විට,
    - ➢ ඉ-තැපැල් පණිවිඩයේ අඩංගු අතුරු පිවිසුම් සම්බන්ධක වලට ඇතුලු නොවන්න.
    - ➢ කිසිදු ඇමුණුමක් බාගත නොකරන්න.
    - ➢ එම ඉ-තැපැල් පණිවිඩය නැවත කිසිවකුට නොයවන්න.
    - ➢ ඔබගේ පෞද්ගලික තොරතුරු කිසිවක් ඇතුලත් නොකරන්න.

## පලමු අවස්ථාව (Scenario 1)

"ඇන්ඩෲ" යනු විදේශ සේවාදායකයින් හා ගනුදෙනු කරනා ව්‍යාපාරිකයෙකි. බොහෝ විට ඔහුට ලොව පුරා සංචාරය කිරීමට සිදුවේ. අද උදෑසන ඔහුගේ මිත්‍රයකු වන "ජේම්ස්" හට පහත අකාරයේ ඉ-තැපැල් පණිවිඩයක් ලැබුනි.

==================================================================

From: Andrew@mail.com
To: James@tmail.com
Subject: "James I need a big favor"

Hi James,

Dude, Currently I am in Germany and I am facing a big problem right now. I lost my valet last night. I lost all my credit cards and cash. Herewith I am sending account details of hotel manager which I reside at the moment. I will return the money when I come back. I have deactivated all my cards few minutes ago. Your help would me much appreciated.

Name: Michel Thomas Account Number: 100938883980 Bank: Barclays Bank

Best Regards
Andrew.

==================================================================

### මෙවැනි ඉ-තැපැල් පණිවිඩයක් ලැබුණ් විට ඔබ කුමක් කළ යුතුද?

- ➢ එම ඉ-තැපැල් පණිවිඩයට පිළිතුරු නොයවන්න.
- ➢ ඔබගේ පෞද්ගලික තොරතුරු කිසිවක් ඉදිරිපත් නොකළ යුතුය.
- ➢ පණිවිඩයේ සඳහන් ගිණුම් වලට මුදල් හුවමාරු නොකරන්න.
- ➢ මේ පිළිබඳ ව TechCERT ආයතනය දැනුවත් කරන්න.

## දෙවන අවස්ථාව (Scenario 2)

පහත ඉ-තැපැල් පණිවිඩය පෙරදින රාත්‍රියේ "මානෙල්" හට ලැබුනි.

==================================================================

From: Mailinglistadmin@Dmail.com
To: Manel1234@Dmaiil.com
Subject: Password Verification

Dear Manel,

Hope you are doing well, Dmail is in the process of verifying all their users' password due to system account upgrade. Please reply to this email by submitting your current password. Your early response would be much appreciated.

Best Regards
Dmail Team.

==================================================================

මෙවැනි ඉ-තැපැල් පණිවිඩයක් ලැබුණ් විට ඔබ කුමක් කළ යුතුද?

- එම ඉ-තැපැල් පණිවිඩයට පිළිතුරු නොයවන්න.
- අන් කෙනෙකුට මෙම ඉ-තැපැල් පණිවිඩය නැවත යොමු නොකරන්න.
- මේ පිළිබඳ ව “Dmail” ආයතනය දැනුවත් කරන්න.
- මේ පිළිබඳ ව TechCERT ආයතනය දැනුවත් කරන්න.

## තෙවන අවස්ථාව (Scenario 3)

“පිලිප්” යනු විකිත්සකවරයෙකි. පසුගිය අවුරුදු 10ක පමන කාලයක් තිස්සේ ඔහු "මෙගා" බැංකුව සමග තම ගනුදෙනු සිදු කරයි. අද උදෑසන ඔහුට පහත ඉ-තැපැල් පණිවිඩය ලැබුනි.

================================================================

From: MegaBankonline@megab ank.com
TO: Philip123@smail.com
Subject: New Internet Banking Features

Dear Customer,

“Mega Bank ” is always thinking about the value added services and try to enthusiast our customers while on their business. “Mega Bank ” Internet banking system now has more features to increase the efficiency of Internet banking Please click the following link and feel the difference.

http://www.megabanknewonline. com/login.php

Best regards
Mega Bank Team

================================================================

මෙවැනි ඉ-තැපැල් පණිවිඩයක් ලැබුණ් විට ඔබ කුමක් කළ යුතුද?

- එම ඉ-තැපැල් පණිවිඩයට පිළිතුරු නොයවන්න.
- ඉ-තැපැල් පණිවිඩයේ අඩංගු අතුරු පිවිසුම් සම්බන්ධක වලට ඇතුලු නොවන්න.
- මේ පිළිබඳ ව “Mega Bank” ආයතනය දැනුවත් කරන්න
- මේ පිළිබඳ ව TechCERT ආයතනය දැනුවත් කරන්න.

ඔබගේ ගැටලු පහත ක්‍රමයන් මගින් අපට දන්වන්න.

https://techcert.lk/en/report-form
දුරකථන - +94 11 4 462 562
ඉ-තැපැල් - help@techcert.lk

මෙම ලිපිය ලක් වසම් අධිකාරිය සහ අන්තර්ජාල සමාජයේ ශ්‍රී ලාංකීය ශාඛාව එක්ව සකසන ලද්දකි. වැඩි විස්තර සඳහා පිවිසෙන්න. http://nic.lk/index.php/training-materials.



Sri Lanka Chapter
HELPING YOU SECURE YOUR INFORMATION ASSETS